# චිරන්තන සමාජයේ ජන මාධ්‍යයක් ලෙස භාවිත වූ අභිලේඛනය

**ඩබ්ලිව්. එම්. ටී. වීරසේකර** *

සිංහල සංස්කෘතියේ මූලාරම්භය සනිටුහන් වන්නේ විජයාගමනයත් සමඟ ය. භාෂා සාහිතය, සිරිත්, විරිත්, අභිචාර විධි, සන්නිවේදන ක්‍රම, කලා ශිල්ප ඇතුළු සංස්කෘතිකාංග ඔවුන් මෙරටට රැගෙන ආ අතර, ඒවා මෙරට විසූ ස්වදේශිකයන්ගේ ඇතැම් සංස්කෘතිකාංග සමඟ මුසු වී දේශීය සංස්කෘතියක් ස්ථාපනය වූ බව පිළිගැනීමට සාක්ෂි ඇත.[1]


විජයාවතරණයෙන් වසර දෙසිය තිස්හයක් පමණ ඉක්ම වූ පසු, ආසන්න වශයෙන් පරම්පරා තුනකට පමණ පසුව මහින්දාගමනය සිදුවන අතර එතැන් පටන් සිංහල බෞද්ධ සංස්කෘතියක් මෙරට ස්ථාපිත වී වර්ධනය වන්නට විය. දුමින්දාගමනය ඉහත කී සංස්කෘතික පෝෂණයට තව ද රුකුලක් විය. මධ්‍යතන යුගය, සිංහල සංස්කෘතියේ පරිනත අවධිය වූ අතර එහි ස්වභාවය හඳුනා ගැනීම සඳහා ප්‍රාමාණික විද්වත් සහභාගීත්වය ලැබී ඇති බව ඒ පිළිබඳ ලියවී ඇති පත පොතින් පෙනේ.

පැරණි සිංහල සමාජයේ ආගමික, දේශපාලනික, ආර්ථික හා සාමාජික බලවේග විසින් හික්මවන ලද සහ ඒවායෙහි අන්තර්ක්‍රියාකාරීත්වයට හේතු පාදක වූ ප්‍රබල සන්නිවේදන රටාවක් එකල ක්‍රියාත්මක විය.[2] අන්තර් පුද්ගල සන්නිවේදනය හා සමූහ සන්නිවේදනය මිනිසාගේ දෛනික කටයුතුවලට මෙන්ම සාහිත්‍ය රස වින්දනය වැනි ශාස්ත්‍රීය කාර්යයන් සඳහා උපයෝගී වූ ආකාරය සීගිරි ගී තුළින් දැකිය හැකිය.[3] සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම හා ජනශ්‍රැතිය ද, අභිලේඛන මාධ්‍යය ද පැරණි සමාජයේ සන්නිවේදන මාධ්‍යයන් වශයෙන් ක්‍රියාත්මක විය. ඒ මඟින් ආගමික, දේශපාලනික, ආර්ථික හා සාමාජික යන අංශවල අන්තර්පෝෂණයක් සිදු විය. කලින්කලට මතුවන සමාජීය අවශ්‍යතා අනුව ලැබෙන ප්‍රතිචාරවලින් ඉහත කී සන්නිවේදන මාධ්‍යයන්ගේ හා ක්‍රමවේදයන්ගේ ප්‍රතිපෝෂණය සිදු විය. එය පහත සඳහන් සටහනින් පැහැදිලි වේ.

පැරණි සමාජයේ පැවති සන්නිවේදන රටාව තුළ සන්නිවේදන උපාය මාර්ග වශයෙන් ක්‍රම හතරක් ක්‍රියාත්මක වූ බව දක්නට ඇත. පුද්ගල වශයෙන් නැතහොත් අන්තර්පුද්ගල සන්නිවේදනය හා සමූහ සන්නිවේදනය, සාම්ප්‍රදායික සන්නිවේදනය, ජනශ්‍රැති සන්නිවේදනය, අභිලේඛන සන්නිවේදනය, වශයෙන් කොටස් හතරකට බෙදා දැක්විය හැකිය.

---

* ඩබ්ලිව්. එම්. ටී. වීරසේකර, ශාස්ත්‍රවේදී (විශේෂ), ශාස්ත්‍රපති (පේරාදෙණිය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. විද්‍යුත් තැපැල: weerasekaratissa@yahoo.com




ඉහත සටහනෙහි පෙන්වන අයුරු සාම්ප්‍රදායික මාධ්‍ය වශයෙන් සලකන ලද ශ්‍රව්‍ය දෘශ්‍ය චිහ්නයන් වශයෙන් සන්නිවේදනය සඳහා පැරණි සමාජයේ භාවිත වූ බොහෝ දේ දක්නට ඇත. කුඩ, කොඩි, සේසත්, බෙර, දවුල්, තම්මැට්ටම්, හොරණෑ, කොම්බු, කස, නිල අඩයාලම් ඇඳුම් පැළඳුම් සහ මිනිසා විසින් නිර්මාණය කර ගන්නා ලද නොයෙක් සංකේත ද සාම්ප්‍රදායික මාධ්‍ය තුළ දක්නට ඇත. එහෙත් ඒවායින් සූචක සන්නිවේදනාර්ථ අන්තර්පුද්ගල සන්නිවේදනය හෝ කණ්ඩායම් සන්නිවේදනය ඉක්මවා නොයන බව පෙනේ.

එසේ වුව ද, ජනශ්‍රැති සහ අභිලේඛනය වත්මන් ජන මාධ්‍යයට සාපේක්ෂව එක්තරා ප්‍රමාණයකට හෝ ජන මාධ්‍ය ලක්ෂණවලින් සමුපෙත වූ මාධ්‍යයක් වශයෙන් හැඳින්විය හැකිය. මෙයින් අප අවධානය යොමු වන්නේ අභිලේඛනයෙහි ඇති ජනමාධ්‍ය ලක්ෂණ පිරික්සීම කෙරෙහි ය.

ජන සන්නිවේදනයෙන් සමාජයට ඉටුවිය යුතු ප්‍රධාන මෙහෙයයන්[4] වත්මන් සන්නිවේදන විද්වතුන් විසින් හඳුනාගනු ලැබ ඇත. තොරතුරු සම්පාදනය, පෙළඹවීම, විනෝදාස්වාද සම්පාදනය, අධ්‍යාපනය යන මෙහෙයයන් ප්‍රධාන වශයෙන් ජන සන්නිවේදනයෙන් අපේක්ෂා කෙරෙන අතර ජනමාධ්‍යය මඟින් විශාල ජන සමාජයකට එම සේවා සැපයිය යුතුව ඇත.

අභිලේඛනයෙන් සිදු වූ ජන සන්නිවේදන කාර්යයන් පරීක්ෂා කිරීමට පෙරාතුව එහි ඇති ජන මාධ්‍ය ලක්ෂණ පරීක්ෂා කර බැලිය යුතුව ඇත. එය තත්කාලීන සමාජයේ පැවැති අනෙකුත් සන්නිවේදන මාධ්‍යයන් අභිබවා විශාල ජන කණ්ඩායමක පරිශීලනයට හේතු වූ සාධක කිහිපයක් හඳුනාගත හැකිය.

1. අභිලේඛනය ස්ථාවරව හා පැහැදිලිව දීර්ඝ කාලයක් පවත්නා මාධ්‍යයක් වීම,
2. ප්‍රසිද්ධ ස්ථානයක මෙන්ම සුදුසු ස්ථානයක පිහිටුවීම නිසා විශාල පිරිසකට කියවීමට හැකිවීම,
3. තරමක් අපහසුවෙන් වුව ද, ටැම්ලිපි හා පුවරුලිපි තැනින් තැනට ගෙනයාමට හැකිවීම,
4. දෘශ්‍ය සාක්ෂරතාවෙන් පමණක් යුතු සමාජ කොටස්වලට ද පරිශීලනය කළ හැකි පරිදි සංකේත ඇතුළත් කර තිබීම

යන කරුණු හේතු කොට ගෙන ශිලාලේඛනය තත්කාලීන සමාජයේ අනෙකුත් සන්නිවේදන මාධ්‍යයන් අභිබවා ගිය බව පෙනේ. ලංකාව පුරා ශිලා ලේඛන විශාල සංඛ්‍යාවක් පිහිටුවා තිබීමෙන් පෙනී යන්නේ ද කාලාන්තරයක් තිස්සේ පෘථුල වශයෙන් ජාතික මට්ටමින් ඒවා භාවිත වූ බවය. තත්කාලීන සමාජයේ අභිලේඛනය ස්ථාවර හා කල්පවත්නා මාධ්‍යයක් ලෙස පිළිග ැනීමට ලක්වී තිබුණි. නිශ්ශංකමල්ල රජුගේ (1187-1196) දඹුලු ගිරිලිපියේ සඳහන් කොට ඇත්තේ දිරායන පත්වල ලියනවාට වඩා තඹපත්වල ලියා පමුණු දීමනා ස්ථාවර කළ බව ය.[5] ඒ පිළිබඳ ඔහු සඳහන් කිරීමට යොදා ගෙන ඇත්තේ ද සෙල්ලිපියක් වීම විශේෂයකි.

අභිලේඛනයේ දීර්ඝ කාලීන පැවැත්ම පිළිබඳ ජනතා පිළිගැනීමක් ද තිබිණි. ජන වහරේ එන "ගලේ කෙටූ අකුරක් සේ" යන කියමනට මුල් වී ඇත්තේ අභිලේඛනයේ ස්ථාවර ස්වභාවයයි. සියවස් ගනනාවක් තිස්සේ විශාල ග්‍රාහක පිරිසක් දැනුවත් කිරීමට ශිලාලේඛනයට ඇති හැකියාව සාර්වත්‍රිකව පිළිගැනුණු සත්‍යයකි.

ශිලාලේඛන පිහිටුවා ඇති ස්ථාන අනුව ද විද්වත්හු ඒවා වර්ග කර දක්වති. ලෙන්ලිපි, ගිරිලිපි, ටැම්ලිපි, පුවරුලිපි සහ වෙනත් ස්ථානවල පිහිටුවා ඇති ලිපි වශයෙන් අභිලේඛන වර්ග කර ඇත. මෙරට ශිලාලේඛන කලාව ඇරඹෙන්නේ ලෙන් ලිපියෙන් බව සඳහන් කළ හැකිය. බුදු දහම මෙරටට ලැබීමත් සමඟ ම ශාසන මාමක ජනයා සිය ධනය වැය කොට ස්වභාවික ගල් ලෙනක් මහා සංඝයාගේ පරිහරණය පිණිස සකස් කොට සතර දිග්භාගයේ විසූ මහා සංඝයා වහන්සේට පුදා ඇත. එම සද්කාර්ය මහා සංඝයා වහන්සේටත් පොදු මහජනතාවටත් දැනුම් දීම සඳහා ගල් ලෙනේ ඉහළ ස්ථානයක, බොහෝවිට කටාරමට පහළින් සකස් කරගත් ස්ථානයක පූජා වාක්‍යයක් කොටා ඇත. වෙස්සගිරි ලෙන්වල කොටා තිබූ පූජා වාක්‍ය කිහිපයක් මෙසේ ය.[6]

"පරුමක-පලිකද-පුත පරුමක-මහ-හරුමස ලෙණෙ චතුදිශ ශගශ"

පරිවර්තනය: ප්‍රමුඛ පලිකදගේ පුත්‍ර ප්‍රමුඛ මහ හරුම නායකයාගේ ලෙන සිව්දිග සඟනට (පුදන ලදී).

"ගපති-නග-පුත-තිශහ ලෙණෙ ශගශ"

පරිවර්තනය: ගෘහපති නාගගේ පුත් වූ තිස්සගේ ලෙන සඟ සතු කරන ලදී.

ගල්ලෙනක් සංඝාවාසයක් ලෙස සකස් කොට පුද කළ අයගේ පරම්පරා නාමය සහිතව නම සඳහන් කොට ඇති අතර, ඇතැම් විට දායකයාගේ පෞද්ගලික අනන්‍යතාව තහවුරු කරන චිහ්නයක් හෝ සන්නිවේදන සංකේත කිහිපයක් ඇතැම් ලෙන් ලිපියක දැකිය හැකිය.

ජනයා ගැවසෙන ස්ථානයක පිහිටි ස්වභාවික ගල් කුලක ජනතාවගේ ඇස පහසුවෙන් යොමුවන ස්ථානයක සෙල් ලිපියක් පිහිටුවා තිබීම බොහෝ විට සිදුවිය. වෙස්සගිරිය, මිහින්තලේ, මහරත්මලේ, පෙරුමියන්කුලම ඇතුළු බොහෝ ස්ථානවල ගිරිලිපි දක්නට ඇත. ගිරිලිපිය ලෙන්ලිපියට වඩා විස්තරාත්මක කරුණු දැක්වීම සඳහා යොදා ගෙන ඇත.

විහාරාරාම පාලනය, සංඝ සමාජය පාලනය, ඉඩම් පරිහරණය සඳහා ප්‍රකාශිත අණපනත් ආදිය ජනතාවට දැනුම් දීම සඳහා ගිරිලිපි උපයෝගී කරගෙන ඇත. පුවරුලිපි වශයෙන් හඳුන්වා ඇත්තේ ගල් පුවරුවක කොටන ලද සෙල්ලිපි ය. මෙහි විශේෂත්වය වන්නේ අවශ්‍ය ස්ථානයකට ගෙන ගොස් තැබීමේ හැකියාව ය. ටැම්ලිපි වශයෙන් හැඳින් වෙන්නේ චතුරශ්‍රාකාර ශිලා ස්ථම්භයක පැති හතරේ ම හෝ කිහිපයක ලියන ලද ලිපිවලට ය. පුවරුලිපියක හෝ ගිරිලිපියක තරමට දීර්ඝව නිවේදන ඉදිරිපත් කිරීමට ටැම් ලිපියක අවකාශ නොමැති වුව ද රැගෙන යාමේ හැකියාව අතින් ටැම් ලිපිය ඉදිරියෙන් සිටී.

ටැම්ලිපි බොහොමයක් භාවිත කර ඇත්තේ රාජ්‍ය සභාවේ කෙටි නිල නිවේදන ඉදිරිපත් කිරීම සඳහා ය. මේවා රාජ්‍ය සභාවේ අනුමැතියෙන් කරන ලද ලේඛන වන අතර අත්තානි, ලේඛන වශයෙන් ප්‍රසිද්ධියට පත්ව ඇත. අත්තානි, ලේඛන රාජ්‍ය සභාවේ සුපරීක්ෂාකාරිත්වය යටතේ සකස් කොට අවශ්‍ය ස්ථානයකට ගෙනගොස් ස්ථාපනය කරන්නට ඇත. ඇතැම් විට රාජ ලාංඡනය පිහිටුවීමත්, එය ගෙන ගොස් අවශ්‍ය ස්ථානයේ පිහිටුවාලූ නිලධාරීන් පිළිබඳ සඳහන්වීමත් මඟින් පෙනී යන්නේ ඒවායේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ඇති බව ය. මෙවැනි ටැම්ලිපි රාශියක් ශ්‍රී ලංකාවේ අභිලේඛන අතර දක්නට තිබේ.[7]

ඉහත කී ස්වභාවයේ හෝ ස්ථානවල පිහිටුවන ලද ලිපි හැරුන කොට කෙටි සහ දීර්ඝ සෙල් ලිපි රාශියක් විවිධ ස්ථානවල පිහිටුවා ඇත. පිය ගැට, ගොඩනැගිලි පාදම්, වාත්ගල්, ගල් ඔරු, ශිලා ආසන හෝ වෙනත් යෝග්‍ය ස්ථාන මේ සඳහා යොදාගෙන තිබිණි. ග්‍රාහකයාගේ ඇස පහසුවෙන් යොමු කර ගත හැකි ස්ථානයක් මේ සඳහා තෝරා ගෙන තිබීම ද විශේෂයෙන් සඳහන් කළයුත්තකි.

කෙටි සරල පෞද්ගලික නිවේදනයකින් ඇරඹි අභිලේඛන කලාව පසු කාලීනව ප්‍රධාන රාජ්‍ය මාධ්‍ය වූ අතර, ඒවා ආකර්ශනීය අයුරින් සකස් කළ බව ද දක්නට ඇත.[8] එමඟින් පරිපූර්ණ සහ විස්තීර්ණ නිවේදන ජනතාවට දැනුම් දී ඇත. අතීත සමාජයේ පොදුජන මාධ්‍යය බවට අභිලේඛනය පත්වීමට හේතු වූ කාරණා අතර වැදගත් තැනක් හිමි වන්නේ එය සමාජයේ පංති ස්තර කිහිපයක ජනතාවට එකවිට පරිශීලනය කළ හැකි වීම ය.

නූතන සන්නිවේදන විද්වතුන් විසින් හඳුන්වා දෙන ලද පරිදි, පුද්ගලයා තුළ සන්නිවේදන අරමුණු ජනිත කරන මූලයන් කිහිපයකි. නැතහොත් සන්නිවේදනයේ මූලික අඩිතාලම වන අන්තරාවර්තී සන්නිවේදනයට (Intra-personal communication) හේතුවන සාධක කිහිපයකි.

ඒවා කෙටියෙන් S - 3 සහ T – 2 වශයෙන් හඳුන්වා ඇත. Sight (පෙනීම) sound (ශබ්දය) smell (ආග්‍රහණය) යන මූලයන් තුන සහ taste (රස) touch (ස්පර්ශය) යන දෙක ය.[9]

මෙම මූලයන්ට අනුකූලව ඍජු සංකේත භාවිත කරමින් පුද්ගලයා තුළ එවැනි මනෝභාවයක් ගොඩ නැගීම සංකේත සන්නිවේදනය දී සිදු වේ. සංකේතය සඳහා ආරෝපිත අරුත සංකීර්ණ වන තරමට එහි දුරවබෝධ ලක්‍ෂණ වර්ධනය වේ. අක්‍ෂර යනු දෘශ්‍ය සංකේතයක් විකාශනය වී ශබ්ද සංකේතයක් බවට පත්වීමය.[10]

සාක්‍ෂරතාව ලබා ගැනීම සඳහා බුද්ධිමය පරිශ්‍රමයක් හා පුහුණුවක් ලැබිය යුතු අතර ඒ සඳහා එක්තරා මට්ටමක බුද්ධිමය ධාරිතාවක් පුද්ගලයා සතුවිය යුතු ය. දෘශ්‍ය සාක්‍ෂරතාව නැතහොත් සංකේත කියවීමේ හැකියාව සංස්කෘතිය මඟින් පුද්ගයාට පවරා දෙනු ලබන බැවින් ඒ සඳහා විශාල කැපවීමක් හෝ දැඩි බුද්ධිමය පරිශ්‍රමයක් අවශ්‍ය නොවේ. සමාජයේ වැඩි පිරිසකට සාක්‍ෂරතාව නොමැති විට සන්නිවේදන අවශ්‍යතා සැපිරිමට දෘශ්‍ය සංකේත භාවිත කළ යුතු වෙයි. දෘශ්‍ය සංකේත ලිඛිත සන්නිවේදනය ඌන පූරණය සඳහා ද, ලිඛිත සන්නිවේදනය තීව්‍ර කිරීම සඳහා ද යෙදේ.

පැරණි සමාජයේ ජෙක සන්නිවේදන සම්ප්‍රදායක් වූ අභිලේඛනය තුළ ජන සංස්කෘතියේ එන ඇතැම් සංකේත යොදා ගැනීමට සිදු වූයේ ඒවා සමාජයේ බොහෝ පිරිසකට ගෝචර වන මාධ්‍යයක් බවට පත් කරලීම සඳහා ය. සෙල්ලිපිවල සඳහන්වන ත්‍රිවිධ සංකේතවලින් ව්‍යංගාර්ථවත් සංකේත[11] වශයෙන් හඳුන්වා ඇති සංකේත හතළිහක් පමණ දක්නට ඇත. ඉර හඳ, බල්ලා, කවුඩා, සර්පයා, මාලුවා, දුක්ගත මිනිස් රුව, ප්‍රේත රුව, වටාපත, චෛත්‍යය, දුන්න, හීතලය, ස්වස්තිකය, පුන්කලස, නෙලුම්මල, හක්ගෙඩිය, ධර්මචක්‍රය, ත්‍රිශූලය, ප්‍රදීපය, අංකුසය, අඬුව, මිටිය, දෑකැත්ත, කැත්ත, නැව යන සංකේත ඒ අතර වෙයි. ඒවායේ සන්නිවේදනාර්ථ සහ සංකේත පහත සඳහන් පරිදි පෙන්වා දිය හැකිය.

| සන්නිවේදනාර්ථ | සංකේත[12] |
|---|---|
| 1. අභිලේඛනයේ සඳහන් කටයුත්ත මංගල, සුභ හෝ රජයේ කටයුත්තක් බව නිවේදනය කිරීම | නෙලුම්මල, පුන්කලස, හක්ගෙඩිය, චක්‍රය, ත්‍රිශූලය, ස්වස්තිකය, සෝලු යෂ්ටිය, හස්ලකුණ |
| 2. ශාසනික කටයුත්තක් බව අවධාරණය කිරීම | චෛත්‍යය, ධර්මචක්‍රය නෙළුම්මල, ප්‍රදීපය සිරිපතුල |
| 3. පනවන ලද නියෝග හෝ රාජාඥාව සදහටම පැවතිය යුතු බව අවධාරණය කිරීම | ඉර, හඳ |
| 4. පනවන ලද නියෝග කඩ කිරීමෙන් මේ ආත්මයේ රාජ උදහසට ලක්වන | චන්ඩාල රුව, බල්ලා[13] කවුඩා. සර්පයා, |

| | |
|---|---|
| බව, මතු ආත්මවල ඵලවිපාක ලැබෙන බව, සඳහන් කිරීම | දුක්ගත මිනිස් රුව<br>ප්‍රේත රුව |
| 5. ප්‍රදානය කළ අයගේ අනන්‍යතාව හඳුන්වන චිහ්න සහ පාරිභෝජනය හෝ ඇතුළු වීම තහනම් කළ පුද්ගලයන් දැක්වෙන චිහ්න | මාළුවා, ස්වස්තිකය<br>දුන්න, හීතලය, අංකුසය<br>අඬුව, මිටිය, දෑකැත්ත<br>නැව, චෛත්‍යය |

මේ අනුව පෙනී යන්නේ අභිලේඛනය සමාජයේ වැඩි පිරිසක් අරමුණු කරගත් සන්නිවේදන ක්‍රමෝපායක් ලෙස භාවිත කළ බව ය.

ඩෙනිස් මැක්වේල් (Denis McQuail) පෙන්වා දෙන පරිදි සන්නිවේදන සහ සංකේත සම්ප්‍රේෂණයේ, බලය වෙනත් බලයකට වඩා වෙනස්වන්නේ එය ද්‍රව්‍යමය නොවන සාධක මත රඳා පවතින බැවිණි. විශ්වාසය, ජාතිකත්වය, ගෞරවය, හොඳහිත, දයාව, ආදරය ආදිය එම සාධක වශයෙන් ඔහු හඳුන්වා දෙයි.

ඉහත කී සාධක තුළ පංචවිධ ක්‍රියාකාරිත්වයක් ඔස්සේ සන්නිවේදනයේ බලය ක්‍රියාත්මක වන බව හෙතෙම පෙන්වා දෙයි.[14]

- ➢ තොරතුරු සැපයීම
- ➢ ක්‍රියාකාරී වීම සඳහා උත්තේජනය සැපයීම
- ➢ අවධානය වෙනස් මගකට යොමු කර වීම
- ➢ පොලඹවා ලීම
- ➢ පවතින තත්ත්වය අර්ථකථනය කර යථාර්ථය පෙන්වා දීම

අභිලේඛන මාධ්‍ය හරහා සන්නිවේදනයේ බලය මැනවින් ක්‍රියාත්මක කිරීමට රාජාංණ්ඩුවට හැකිවී ඇති බව අභිලේඛනයේ අන්තර්ගත සන්නිවේදන දාරණාව පරීක්ෂා කිරීමෙන් මැනවින් පැහැදිලි වෙයි. ඒවායේ අන්තර්ගත කරුණු පහත සඳහන් පරිදි පෙළ ගැස්විය හැකිය.

- ➢ රාජාණ්ඩුවේ නීති නිවේදන ප්‍රකාශ කිරීම.[15]
- ➢ ආයතන හෝ පුද්ගලයන් සඳහා කෙරෙන ප්‍රදානයන් හෝ විශේෂ වරප්‍රසාදයන්, තහංචි යනාදිය නිවේදනය කිරීම.[16]
- ➢ කථිකාවත් සහ ගිවිසුම් පිළිබඳ නිවේදන ඉදිරිපත් කිරීම.[17]
- ➢ රාජකීය සිද්ධි හෝ කාර්යයන් වාර්තා කිරීම.[18]

යනාදි කටයුතු තත්කාලීන සමාජයේ ජනතාවට දැනුම් දෙන ප්‍රධාන මාධ්‍යය වශයෙන් අභිලේඛනය පිළිගැනී තිබුණු බව දක්නට ඇත. රජතුමා විසින් රාජ්‍ය සභාවේ අනුමැතියෙන්, සංඝ සමාජයේ යහ පැවැත්ම උදෙසා හෝ විහාරාරාම පාලනය කිරීම උදෙසා හෝ ජනතාවගෙන් බදු අය කිරීම උදෙසා හෝ නීති පනවනු ලැබ ඇත. ඒවා විධිමත් පරිපූර්ණ රෙගුලාසි අඩංගු ව්‍යවස්ථා

ලෙස සැලකිය හැකිය. මිහින්තලේ සිව්වන මිහිඳු රජුගේ පුවරුලිපි දෙක, ජේතවනාරාම සංස්කෘත සෙල්ලිපිය, අනුරාධපුරයෙහි පස්වෙනි කසුබ් රජුගේ පුවරුලිපිය, සිව්වන මිහිඳු රජුගේ අනුරාධපුරය ගල් ඔරුව අසල පුවරුලිපිය ආදියෙහි ආරාම පාලනය, සංඝ සමාජය පිළිබඳ අණපණත්, ඉඩම් පාලනය සහ බදු අය කිරීම වැනි තොරතුරු අඩංගු වේ.

බොහෝ විට ආයතන හා පුද්ගලයන් වෙත සිදු කෙරෙන ප්‍රදානයන්, වරප්‍රසාද හා තහංචි නිවේදනය කළේ අත්තාණි ලේඛන මඟිනි. රජතුමා හෝ අධිකාරිබලය ලත් පුද්ගලයකු විසින් රාජ්‍ය සභාවේ අනුමැතියෙන් පුද්ගලයෙකු හෝ ආයතනයක් වෙත කරනු ලබන ප්‍රදානයන් රාජ්‍ය නිල ලාංඡනය පිහිටුවා ප්‍රසිද්ධ කිරීම, අත්තාණි ලේඛන මඟින් සිදුකරනු ලැබ ඇත. කෙටි නිවේදන සඳහා ඌන පුරණ වශයෙන් සංකේත යෙදීම ද අත්තාණි ලේඛනවල දක්නට ඇත.

කථිකාවත් සහ ගිවිසුම් පිළිබඳ නිවේදන රාජකීයන්ගේ කාර්යයන් හෝ චාරිකා පිළිබඳ වාර්තා මහජනයා හමු වේ තැබීමට අභිලේඛනය යොදා ගෙන ඇත. ඉහත සඳහන් සියලුම කරුණු. තොරතුරු ප්‍රකාශන ලෙස හැඳින්විය හැකි අතර, එයින් සන්නිවේදනය වන කරුණු මගින් පුද්ගලයාගේ ක්‍රියාකාරකම් උත්තේජනයට ලක් කෙරෙන බව පෙන්වා දිය හැකිය.

අවශ්‍ය දේ පිළිගැනීමට සහ අනවශ්‍ය දේවලින් ඉවත්වීමට පුද්ගලයා පෙලඹවීම උක්ත සන්නිවේදනයෙන් සිදු වෙයි. පාලක පන්තියට අවාසිදායක මතවාදයක් සමාජයේ පැතිරී ගිය විට හෝ පැතිර යාමේ අවදානමක් පවතින විටක මිනිසුන්ගේ අවධානය වෙනත් අතකට යොමු කිරීමට සන්නිවේදනයේ බලය උපයෝගි කර ගැනීමට අතීතයේ සිටි පාලකයන් ද පෙලඹී සිටි බව පෙනේ.

සිය රාජ්‍ය අයිතිය සහ බලය තහවුරු කර ගැනීමෙහි ලා ප්‍රචාරක ව්‍යාපාරයක යෙදුණු නිශ්ශංකමල්ල රජතුමා ජනතා අවධානය, පූර්වගාමීන්ගේ වැරදි සහ දුර්වලකම් කෙරේ යොමු කර ඇත. එසේම "නිශ්ශංක" සංකල්පයක් ගොඩ නැඟීමට කටයුතු යෙදීමටත්, නිරන්තර චාරිකාවල යෙදෙමින් ජනතා අවධානය තමන්ට වාසිදායක ලෙස යොමු කර ගැනීමටත් නිශ්ශංකමල්ල රජුට හැකි විය.

අභිලේඛන සන්නිවේදනය මඟින් ජනතාව පෙලඹ වූ කරුණු කිහිපයකි. බුදු දහම පිළිගැනීම, අනුගමනය කිරීම, රැකීම, රාජාණ්ඩුවේ නියෝග පිළිපැදීම, රජතුමාට පක්ෂපාතවීම යන කාර්යයන් කෙරේ ජනතාව පෙලඹ වීය. ඒ නූතන ජන සන්නිවේදන ප්‍රවාහයේ ප්‍රධාන ශක්තියක් වශයෙන් සැලකෙන්නේ පවතින තත්ත්වය අර්ථකථනය කර ග්‍රාහකයාට යථාර්ථය පෙන්වා දීමට ඇති හැකියාව ය. එය ඇතැම් විට කුමන හෝ බල අධිකාරියකට විරුද්ධ සටනක් බවට පත් වීමට ඉඩ ඇත්තේ ඔවුන් විසින් පවතින යථාර්ථය වැසීමට කටයුතු කරන විට ය. බුදු සසුන සම්බන්ධ කථිකාවත් මගින් සිදු වී ඇත්තේ පවතින තත්ත්වය අර්ථකථනය කර නිවැරදි මඟ, පැහැදිලි කරදීම සහ ප්‍රතිපාදන යෙදීම ය.

එසේ වුව ද, රාජ්‍ය අංශයේ පවතින අයෝග්‍ය තත්ත්වයන් පෙන්වා දීමට රාජ්‍ය මාධ්‍යයක් වූ අභිලේඛනය නොයෙදීම පුදුමයක් නොවේ. එවැනි විටෙක පොදු ජන මාධ්‍යයක් වූ ජන සාහිත්‍යය, ජන නාට්‍යය ඇතුළු ජනශ්‍රැතිය යොදා ගෙන පවතින තත්වයන් අර්ථකථනය කර

විරෝධාකල්ප ප්‍රචාරය කිරීමට ජනතාව පෙළඹුන බව සීතාවක හා මහනුවර යුගයේ පැවති ජන සාහිත්‍යය, සැහැලි හා ජන නාට්‍යවලින් පෙනේ.[19] පැරණි සංනිවේදකයා ආකෘතිය හා භාෂාව නිර්මාණාත්මක ලෙස යොදා ගෙන ඇති බව ද ඇතැම් අභිලේඛනවලින් පෙනියයි.

නිර්මාණාත්මක ලේඛනයට උදාහරණ සපයන ගීයෙන් ලියවුණු සෙල්ලිපි රාශියක් දක්නට ඇත.[20] කුසලාන් කන්ද සහ තෝපා වැව වාන් ඇළ ලිපිවල එන කවි දෙකක් පහත සඳහන් වේ.

කුසලාන් කන්ද ගී ලිපිය

"උපරජ නග පුතෙ
රජ අබයෙ නම තශ පුතෙ
ගමණි තිසෙ නම ලෙණ
කරිතෙ ශුදශන ශගස"

අනුවාදය: නාග උපරජුගේ පුත්‍රයා අභය නම් රජය. ඔහුගේ පුත්‍රයා ගමණි තිශ නම්. ඔහු විසින් සුදර්ශන නම් ලෙන සංඝයා සඳහා කරවන ලදී.

මෙම ලිපිය හුදෙක් වාර්තාවක් කාව්‍ය ආකෘතියට නගා ඉදිරිපත් කිරීමකි. එහෙත් පසු කාලීනව නිශ්ශංකමල්ල රජු කාව්‍ය ආකෘතිය සහ භාෂාව නිර්මාණාත්මක ලෙස යොදාගෙන සිය ප්‍රචාරක අරමුණු ඉටුකර ගත් ආකාරය ඔහුගේ තෝපා වැව වාන් ඇල ටැම් කවි ලිපියේ එන ගීයකින් පෙනේ.

"මිනිමුතු නිල් මරා පුස්රා
ගොමේද වෙරළු විදුරා
පබළු නන් අබරණ සළු
සුවඳ මල බුලත් කපුරා
මෙයින් යෙදී හුනද අඟරා
නොලද හෙ නොමනහරා
බතුපැය කළිඟු නිරින් දු
නුවනින් වින්දු ඉසුරා"

අනුවාදය: මැණික්, මුතු, නිල්, මරකත, පුෂ්පරාග, ගෝමේද, වෛදූර්ය. දියමන්ති, පබළු නා නා අබරණ, සළු, සුවඳ, මලබුලත්, කපුරු, යන මේවායින් සැදී සිටිය ද අංගරාග හෙවත් සුවඳ ආලේප නොලද හොත් හේ මනහර නොවේ. එමෙන්ම රජකු අවශ්‍ය පරිදි ඉටු කළ යුතු බත් ඉපයීම නුවණ මෙහෙයවා කළ කළිඟු රජ ඉසුරු වින්දේ ය.

නිශ්ශංකමල්ල රජතුමා ගොවිතැන් කොට රට ස්වයංපෝෂණය කළ ආකාරය උපමා උපමේයන් ඇසුරෙන් නිර්මාණාත්මකව දක්වයි. මෙම ගීය තුළ නිර්මාණාත්මක සංනිවේදන ලක්ෂණ දක්නට ඇත. නිර්මාණාත්මක බව අභිබවා ප්‍රචාරාත්මක බව ඉස්මතු වුවහොත් කෘතිය කෙරේ යොමු වන ග්‍රාහක අවධානය අඩු වෙයි. ප්‍රචාරාත්මක බව අභිබවා යන නිර්මාණශීලි ගුණයක් මෙම ගීයේ දක්නට ඇත.

ගීයෙන් ලියවුණු ශිලාලේඛන අතර කොස්සෝගම කන්ද, කරඳහෙල, කොරකොට, කිරින්ද, කුසලාන් කන්ද, නුවර ගල් කන්ද, ආඬියා කන්ද, පදවිය වැවේ වෑ කන්ද, ගල්පොත, ලෙනගල, ආදී ලිපි වෙයි. ගද්‍යයෙන් අලංකාරෝක්ති යොදා ගෙන සිය ප්‍රචාරක කාර්යයන් නිර්මාණාත්මකව ඉදිරිපත් කරමින් පොදු ජනයා රාජ්‍ය පාක්ෂික කර ගැනීම සඳහා පෙළඹවීම බොහෝ රජවරුන්ගේ අභිප්‍රාය වී ඇත. තමන්ගේ කුලය, ඔද තෙද, රාජ්‍ය පාලනයේ පුහුණුව, උගත්කම හා බෞද්ධ කම ප්‍රචාරය කිරීමට අතිශෝක්තිය සහ උපමා උපමේයන් යොදා ගත් රජවරු කිහිප දෙනෙක් සිටිති. පස්වෙනි දප්පුල රජුගේ (ක්‍රි. ව 940-952) වෙස්සගිරි ලිපිය, සිව්වන මිහිඳු රජුගේ (975-991) ලිපිය IV වෙනි මහින්ද රජුගේ ජේතවනාරාම පුවරු ලිපිය, නිශ්ශංකමල්ල රජතුමා විසින් පිහිටුවන ලද බොහෝ සෙල්ලිපි මේ සඳහා උදාහරණ වශයෙන් දැක්විය හැකිය. අභිලේඛනය ජනමාධ්‍යයක් වශයෙන් භාවිත කරමින් සිය ප්‍රචාරක කටයුතු සාර්ථකව ගෙන ගිය රජුන් අතර ප්‍රමුඛස්ථානය හිමි වන්නේ නිශ්ශංකමල්ල රජුට ය. ඔහු විසින් රචිත රුවන්වැලි දාගැබ පුවරු ලිපියේ කොටසක් පමණක් වුව ද උපුටා දැක්වීම ඒ සඳහා ප්‍රමාණවත් වේ.

> "මෙසෙ ලොකය ද ශාසනය ද සෙමෙහි තබා පුලස්තිපුරයෙහි වැඩවසනසෙයෙක් රුවන්වැලිදාගැබ්වහන්සේ වන්දනා පිණිසැ සියුරඟ සෙනඟ පිරිවරා මහානුභාවයෙන් තමන්වහන්සේට සතරවන්නෙහි නික්මැ දාගැබ්වහන්සේ පෙනෙන මානයෙහි දිමැ වාහනයෙන් බැස ශ්‍රී පාදයෙන් රුවන්වැලිමළුවට වැඩැ මළුවෙහි වැලි තවරන්නා සේ අනන්ත මුතු අතුටැ වැලිතලා පිටැ නන් කුසුම් පුදන්නා සේ රන් මල් රිදී මල් සත්රුවන් සිසාරා නිරතුරුකොටැ පුදා අනැගි පට කඩ පතාකායෙන් දාගබට ආතපණීවාරණය කොටැ සිසාරා නිරතුරුකොටැ කපුරු ගොඩ ගොඩ කොටැ පහන් පුදා තලියන්තෙල් සුවඳතෙල් ආදී වූ තෙලින් සතියක් පහන් පුදා..."

එය වත්මන් බසට නැංවුව හොත් විචිත්‍ර වාර්තාකරණයට සමාන බවක් පෙන්වයි.

> "මෙසේ ලෝකය ද, ශාසනය ද සාමයෙහි පිහිටුවා පුලස්තිපුරයෙහි විසූ රජතුමා අනුරපුරයෙහි පිහිටි රුවන්වැලි දාගැබ්වහන්සේ වන්දනා කිරීම සඳහා පැමිනෙයි. හෙතෙම දාගැබ් වහන්සේ පෙනෙන තෙක් මානයේ දී රථයෙන් බසියි. සිව්රඟ සෙනඟ පිරිවරාගෙන සෑ මලුව වෙත පිවිසෙයි. සුදු වැලි මළුව මත තවද සුදු වැලි අතුරන්නා සේ ඒ මත මුතු කැට අතුරයි. එම මුතු පලස මත තබා රන් රුවන් රිදී මල් හා සත් රුවන් පූජා කරන්නේ වැලි මළුව මත තබා නන් කුසුම් පූජා කරන්නා සේය. දාගැබ් වහන්සේ අවට අහස පට පිළියෙන් සෑදූ ධජ පතාකාදියෙන් සරසයි. සෑ මළුවේ තැනින් තැන ගොඩ ගැසූ කපුරු දල්වා ආලෝක පූජා පවත්වයි. තල තෙලෙන් සුවඳ තෙලෙන් පුරා සතියක් පහන් දල්වයි."

නිශ්ශංකමල්ල රජු තමාගේ ශ්‍රද්ධා භක්තියත්, යුද්ධ ශක්තියත් එකවිට මෙම වාර්තාවෙන් දක්වයි. එසේම රට පුරා චාරිකාවේ යෙදෙන ජන හිත කාමී රජෙකු ලෙස වක්‍රොක්තියෙන් දක්වයි. නිශ්ශංකමල්ල රජුගේ බෙහෝ ලිපි අතිශෝක්තියෙන් ගහන ප්‍රචාරාත්මක ලිප වශයෙන්

එකහෙලා බැහැර කළ නොහැක්කේ එමඟින් නිර්මාණාත්මක සන්නිවේදනයේ මෙහෙයක් වන දැනුවත් විමත් වින්දනයත් එකවිට ලැබෙන බැවිණි.

මෙම ලිපිය තුළ සාකච්ඡාවට බඳුන් වූ කරුණු දෙක වන්නේ නූතන ජන මාධ්‍ය ලක්ෂණ අභිලේඛන මාධ්‍ය තුළ ඇත් ද යන්න සහ නූතන ජන සන්නිවේදන මෙහෙයන්ට සාපේක්ෂව සන්නිවේදන මෙහෙයන් තත්කාලීන සමාජයට ඉටු කර දීමට අභිලේඛන සන්නිවේදනය උපයෝගී වී ඇත්දැයි විමසීම ය.

නූතන ජන මාධ්‍යයේ තාක්ෂණික හැකියාවන් මත එක විට හෝ කෙටි කාලයක් තුළ විශාල ජන කණ්ඩායමකට ඇමතීමට හැකිය. අභිලේඛන මාධ්‍යය එක්තරා කාල පරාසයක් තුළ විශාල පිරිසක් අරමුණු කර ගනිමින් එම කාර්ය ඉටු කරන බව මෙම ලිපියේ දී සවිස්තරව පෙන්වා දී ඇත. ජන සන්නිවේදන මෙහෙයයන් වන තොරතුරු සම්පාදනය, උත්තේජන සැපයීම, පොළඹවා ලීම, පවතින තත්වයන් අර්ථකථනය කිරීම හා යථාර්ථය පෙන්වා දී ම, ජන මනසට බලපෑම් කිරීම යන අරමුණු ඉටු කර ගැනීමට අභිලේඛන සන්නිවේදනය යොදා ගත් ආකාරය පැහැදිලි කර ඇත. - නූතන නිර්මාණාත්මක සන්නිවේදනයේ හා වාර්තාකරණයේ ඇතුළත් ලක්ෂණ හා අභිලේඛන සන්නිවේදනයේ ඇතැම් අංශවල සමාන කම් ද සාකච්ඡාවට බඳුන් කර ඇත.

**සටහන්**

1. විජය ඇතුළු පිරිස ලංකාවට පැමිණෙන විට මෙරට විසූ ජනයා දියුණු සංස්කෘතියකින් හෙබි පිරිසක් බව මහාවංශ (*ම.වං.*) තොරතුරු අනුව පෙනීයයි. *මහාවංශය (සිංහල) ප්‍රථම භාගය,* සංස්, ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, 1996, කොළඹ, 7, 11, පරි. 30, 34 ගාථා

2. *ම.වං.* එම 7, පරි, 51, ගාථාව, 8, පරි, 3, ගාථාව

   *ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය,* 1984, II කාණ්ඩ, සංස්කෘතික දෙපාර්තමේන්තුව, පි. 1682

   විජේතුංග, ගාමිණී, 2003, *ශ්‍රී ලංකාවේ පුවත්පත් අයිතිය සහ දේශපාලන සන්නිවේදනය,* සරසවි, නුගේගොඩ

3. සීගිරි ගී අතර රස වින්දන සාකච්ඡා, (321) සමූහ නිර්මාණ (495,558) සංවාද ගී (27>33, 245>246, 351>222, 384>111) වශයෙන් හඳුනාගත හැකි ගී රාශියක් ඇත. Paranavitane, S,1956, *Sigiri Graffiti*, vol, 1, 2, London, p, 197, 304, 343, 16, 19, 150, 217, 136, 238, 67

4. Joseph, R. Dominick, 1987, *The Dynamics of Mass Communication*, second edition – Random House, New York, p. 30 - 50

5. *ශිලා ලේඛන සංග්‍රහය,* සංස්. කරුණාරත්න, සද්ධාමංගල, 2000, දඹුලු ගිරිලිපිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. කොළඹ, පි. 64